# පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

## උතුරු මැද පළාත - අනුරාධපුර

මෙම අධිකාරියේ පුරප්පාඩුව පවතින ඉංජිනේරු (යාන්ත්‍රික) තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා තම අයදුම්පත් 2026.09.08 වන දින හෝ ඊට පෙර පහත ලිපිනය වෙත යොමු කරන මෙන් දන්වමි.

**ඉංජිනේරු (යාන්ත්‍රික)**

**ශ්‍රේණිය හා වැටුප් පරිමාණය** - 02 ශ්‍රේණිය

96,650-10×2,480-15×3,450-173,200 (MM 1-3-2025)

**වයස් සීමාව** - බඳවා ගන්නා දිනට වයස අවු.45ට වඩා අඩු විය යුතුය. දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ රජයේ, අර්ධ රාජ්‍ය පූර්ව ආයතනයක (සංස්ථා, මණ්ඩල, ව්‍යවස්ථාපිත ආයතන) සේවයේ නියුක්ත අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලනොපානු ඇත.

**01. බාහිර අයදුම්කරුවන් - (පහත සුදුසුකම් i හෝ ii හෝ iii)**

i. යාන්ත්‍රික ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු යාන්ත්‍රික ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයේ යන්ත්‍ර සූත්‍ර හා රථවාහන නඩත්තුව පිළිබඳ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

ii ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ යාන්ත්‍රික ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයට අදාළව ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු යාන්ත්‍රික ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයේ යන්ත්‍ර සූත්‍ර හා රථ වාහන නඩත්තුව පිළිබඳ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

iii තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන යාන්ත්‍රික ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**02. අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත i හෝ ii)**

i ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

ii "කනිෂ්ඨ කළමනාකාර" සේවා ගණයෙහි I ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වෙනත් කොන්දේසි**

- අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන අවසාන දිනය වන විට අදාළ සුදුසුකම් සියලුම ආකාරයෙන් සම්පූර්ණ කර තිබිය යුතුය.
- රාජ්‍ය සේවා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු/සංස්ථා/ මණ්ඩල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්කරුවන් විසින් තමාගේ ජීවදත්ත අඩංගු අයදුම්පත සකස් කර එවිය යුතු අතර, තමා පිළිබඳව තොරතුරු ලබා ගත හැකි දෙදෙනෙකුගේ නම් සඳහන් කර එවිය යුතුය.
- අධිකාරියේ අභිමතය පරිදි කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම හෝ නොකිරීම සිදු කළ හැක.
- බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව 01කි.
- මෙම කොන්ත්‍රාත් තනතුර සඳහා මාසිකව රු.102,896.00ක (85,896.00+17,800.00) දීමනාවක් ඇතුළු අධිකාරිය මගින් ගෙවනු ලබන මාසික දීමනාවද ගෙවනු ලැබේ.
- අයදුම්කරුට විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඇත්තේ නම් එවා සැලකිල්ලට ගෙන ඉහළ ශ්‍රේණියක හෝ යම් ශ්‍රේණියක වැටුප් පරිමාණයෙහි සුදුසු වැටුප් පියවරක තබනු ලැබේ.
- ස්ථිර පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේදී කොන්ත්‍රාත් පදනම මත කරනු ලැබූ සේවය පිළිබඳ කාර්යක්ෂමතාව සලකා බලනු ලැබේ.
- අපැහැදිලි අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, සැලකිල්ලට භාජනය කරනු නොලැබේ.

**ලිපිනය -**
**සාමාන්‍යාධිකාරී,**
**පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,**
**එච්.බී.සේමසිංහ මාවත,**
**අනුරාධපුර,**
**උතුරු මැද පළාත.**